www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද කම්කරුවන්ගේ වැටුප් මත එල්ල කෙරෙන ප්‍රහාරය

## The assault on US workers' wages

**ටොම් එලී සහ බැරී ග්‍රේ විසිනි**

**2010 අගෝස්තු 19**

බදාදා *ෆිනෑන්ෂල් ටයිම්ස්හි* "එක්සත් ජනපදයේ දුරකථන ඇමතුම් මධ්‍යස්ථාන පිරිවැය ඉන්දියාවට සම වෙයි." යන සිරස්තලය යටතේ පල කල ලිපියකින් ඔබාමා පරිපාලනයේ පිටුබලය ලත් මහ ව්‍යාපාර විසින් ඇමරිකානු කම්කරුවන් මත සිදු කරන ඒකාබද්ධ සහ තීව්‍රවන වැටුප් කප්පාදු වැඩ පිලිවෙලෙහි බලපෑම පිලිබඳ යම් ඉගියක් දෙයි.

"ව්‍යාපාර ක්‍රියාවලිය බාහිරට පැවරීමේ රටේ විශාලතම සමාගමේ ප්‍රධානියාට අනුව දුරකථන ඇමතුම් මධ්‍යස්ථාන කම්කරුවන් ඉන්දියාවේ තරම්ම ලාභදායී මට්ටමට එක්සත් ජනපදය තුල සේවයේ යෙදවීමේ හැකියාව ඇත. ඉහල විරැකියා මට්ටම් එක්සත් ජනපදයේ සමහර කොටස් තුල, විශේෂයෙන්ම ස්පාඤ්ඤ ජනයා අතර අඩු-නිපුනතා බාහිරට පැවරීමේ සේවාවන් සඳහා වැටුප් පහතවැටී ඇත." යන්නෙන් ලිපිය ආරම්භ වේ.

ලිපියට අනුව ඉන්දියානු බාහිරට පැවරීමේ ආයතන කිහිපයක් පහල ශ්‍රම පිරිවැයෙන් වාසි ලබා ගැනීමට එක්සත් ජනපදය කරා මෙහෙයුම් මාරුකරමින් සිටී. මෙය 1990 විශාල දුරකථන ඇමතුම් මධ්‍යස්ථාන සහ මෘදුකාංග ආයතන ඇමරිකාවේ මෙහෙයුම් වසා ඉන්දියාවේ උගත් නමුත් අඩු වැටුප් ලබන කම්කරුවන් සූරාකෑමට යාමේ ක්‍රියාවේ ප්‍රතිවිරුද්ධ ක්‍රියාවකි.

"ජනතාව (එක්සත් ජනපදයේ) ඔවුන් පුරුදු වී සිටි ක්‍රමයට වඩා නිවසේ සිට වැඩ කිරීමට සහ පහල වැටුප් වලට වැඩ කිරීමට විවෘතය යන්න පිලිබඳව අප සවිඥ්ඥානික වීම අවශ්‍යය" යනුවෙන් ඉන්දියානු ජෙන්පැක්ට් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී ප්‍රමෝද් බාෂින් අදහස් දැක්වීය. දැනටමත් චිකාගෝ, පෙනිසිල්වේනියා, ටෙනසි සහ නිව්යෝර්ක්වලට වැඩ පවරන මෙම සමාගම ඊලඟ අවුරුද්ද තුල ඇමරිකානු කම්කරු බලකායේ ප්‍රමානය තෙගුන කිරීමට අදහස් කරයි.

*ෆිනෑන්ෂල් ටයිම්ස්හි* ලිපිය, ඇමරිකානු කම්කරුවන්ගේ සහ ආසියාවේ සහ අනෙකුත් නැගීඑන ආර්ථිකයන්හි සුපිරි සූරාකෑවෙන කම්කරුවන්ගේ, වැටුප් අතර පරතර පටු කිරීම සඳහා වූ සංගතවල සහ ආන්ඩුවේ ව්‍යාපාරය සැලකිය යුතු සාර්ථකත්වයක් කරා යමින් සිටින බවට වන දුෂ්ට ඇඟවීමකි. ඇමරිකාවේ සහ ලෝක ධනවාදයේ කඩා වැටීම, ඇමරිකානු කම්කරුවන්ගේ වැටුප් සහ ජීවන තත්වයන් පහත හෙලීමේ සහ සූරා කෑමේ මට්ටම ඉහල නැංවීමේ කාරිය සඳහා පාලක පන්තිය විසින් යොදා ගනිමින් සිටී.

මෙය පන්ති යුද්ධයේ ගනනය කරනු ලැබූ ප්‍රතිපත්තියකි: මහා විරැකියාවෙන් සහ නිවාස සින්න වීම්, පොදු පහසුකම් කප්පාදු, කුසගින්න සහ නිවාස නොමැතිකම පැතිර යාමෙන් හටගන්නා ලද කාලකන්නි භාවයේ සහ ධ්වජභංගයෙන් වාසි ලබා ගැනීමේ නිර්දය හඹා යාමක් එමගින් සිදු කෙරෙයි.

ඔබාමා ධවල මන්දිරය පසුගිය වසරේ ජෙනරල් මෝටර්ස් සහ ක්‍රයිස්ලර් බංකොලොත් භාවයට ඇද දැමීමෙන් හා රථවාහන සමාගම් වලට රාජ්‍ය ඇපදීමක් සඳහා පූර්ව කොන්දේසියක් ලෙස අලුතෙන් බඳවා ගන්නා කම්කරුවන්ගේ වැටුප් අඩකින් කප්පාදු කල යුතු බවට අවධාරනය කරමින් වැටුප් කප්පාදු කිරීම සඳහා දොට්ට දැමීම් සහ වැඩපලවල් වසා දැමීමේ තර්ජනය උපයෝගී කර ගැනීමට මහා සංගතවලට සංඥා කලේය.

දැන් මෝටර් රථ කර්මාන්ත සමාගම්වල නව කම්කරුවන් උපයන්නේ දුගී බවට ආසන්න පැයකට ඩොලර් 14ක වැටුපකි. තව ගැඹුරට යන වැටුප් සහ සහන කප්පාදු සහ වැඩ වේගවත් කිරීමේ සියලු සීමාවන් ඉවත්කිරීම සඳහා ඉල්ලීමට මෝටර් රථ සමාගම් සූදානම් වන තතු තුල මෙය ආරම්භය පමනි. එක්සත් ජනපද ආර්ථිකයේ සෑම අංශයකින්ම මෙබඳු ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබමින් පවතී.

ආසියාවේ මට්ටම කරා ඇමරිකාවේ ශ්‍රම පිරිවැය පහත හෙලීම ඔබාමා පරිපාලනයේ ඊනියා

රැකියා වැඩ සටහනේ හරි මැද පවතී. රජයේ කිසියම්ම රැකියා ඇති කිරීමේ වැඩ සටහනක් ප්‍රතික්ෂේප කරමින් ද ඔවුන්ගේ ම අල්ප උත්තේජක යෝජනා පවා අත්හැර දමමින් සහ බංකොලොත්වූ ප්‍රාන්ත සහ ප්‍රාදේශීය ආන්ඩු සඳහා සහන සැපයීම ප්‍රතික්ෂේප කරමින් ධවල මන්දිරය සහ ඩිමොක්‍රැටික් කොන්ග්‍රස් සාමාජිකයෝ මහා අවපාතයෙන් පසුව ඇති වූ ඉහලම විරැකියා මට්ටම පහල හෙලීමට ඇති සැලසුම අනුව අවුරුදු 5කින් එක්සත් ජනපද අපනයන දෙගුන කිරීමේ පොරොන්දුවක් තැරැව් කරති.

මෙම මූලෝපායේ හරි මැද පවතින්නේ ඇමරිකන් ශ්‍රම පිරිවැය කපා දැමීමේ සහ එම පදනම මත, ගෝලීය වෙලඳපොලවල්වලට නිර්යාත කිරීමේ ලාබ ශ්‍රම වේදිකාවක් ලෙස එක්සත් ජනපද නිෂ්පාදන පුනරුත්තාපනය කිරීමය. ඉන්දියාවේ සිට එක්සත් ජනපදය දක්වා මෙහෙයුම් ගෙන යාම මෙම අධම ප්‍රතිපත්තියේ ප්‍රාථමික සාර්ථක වීමේ සාධකයක් ලෙස වොෂින්ටනය සහ වෝල්වීදිය නිසැකයෙන්ම උත්සවශ්‍රීයෙන් සමරනු ඇත.

වැටුප් සහ සහන කප්පාදුව එක්සත් ජනපද කම්කරු පන්තියේ; ෆැක්ටරි කම්කරුවන් සහ ගුරුවරුන්; රාජ්‍ය සේවකයින් සහ සේවා කම්කරුවන්; කලු, සුදු. හිස්පැනික්; එක්සත් ජනපදයේ ඉපදුනු සහ සංක්‍රමනිකයන්; ගැහැනු සහ පිරිමි; තරුනයින් සහ දශක ගනන් අත්දැකීම් ඇති කම්කරුවන් ඇතුලු සියලු ම කොටස්වලට පහර එල්ල කර ඇත. පුද්ගලික අංශයේ වැටුප 2009 දී සියයට 6 කින් පහත ගිය බව වෙලඳ දෙපාර්තමේන්තුව පසුගිය සතියේ වාර්තා කලේය.

සමාගම් නැවත අධික ලාභ වාර්තා කරන්නේ සහ ප්‍රධාන විධායක නිලධාරීන් අංක හතේ සහ අටේ වන්දි පැකේජ තමන්ටම ප්‍රදානය කරනු ලබන්නේ මෙම පදනම මත ය.

සමාගම් ප්‍රභූව මේ දක්වා මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරවීමට සමත්ව ඇත්තේ අන් සියල්ලටම වඩා ඒඑෆ්එල්-සීඅයිඕ සහ (චේන්ජ් ටු වින්) "ජයග්‍රහනය සඳහා වෙනස් වීම" නම් වෘත්තීය සමිති සම්මේලනයේ සහයෝගීත්වය නිසා ය. ගුරුවරුන්, මෝටර් රථ කම්කරුවන්, පතල් කම්කරුවන් සහ රාජ්‍ය සේවකයින් නියෝජනය කරන්නේ යැයි කියන සෑම වෘත්තීය සංගමයක් ම "රැකියා රැකීමේ" නාමයෙන් වැටුප් කැපීම සඳහා සේව්‍යයන්ගේ ඉල්ලීම් ක්‍රියාවට යෙදවීමට මං සොයති.

වැටුප් මත මෙම ප්‍රහාරය සහ වෘත්තීය සංගම්වල දෙබිඩි භාවය හුදෙක් ඇමරිකානු නොව ජාත්‍යන්තර ප්‍රපංචයකි. *ෆිනෑන්ෂල් ටයිම්ස්* ලිපිය ඉන්දියානු පදනමක් ඇති තොරතුරු තාක්ෂනය බාහිරට පැවරීමේ සමාගමක් වන විප්රෝ ටෙක්නොලොජීස් ආයතනය "යුරෝපයෙන් මැදපෙරදිගින් සහ අප්‍රිකාවෙන් ගෝලීය ආර්ථික අවපාත කාලයේ දී කම්කරුවන් බඳවා ගැනීම ඇරඹි" බව සටහන් කලේය.

ඔවුන්ගේ පීඩනයේ ප්‍රභවය ධනපති ක්‍රමය ම ලෙස හඳුනාගැනීමට පටන් ගනිමින් සිටින හා ඔවුන්ගේ වෘත්තීය සංගම් තම ප්‍රධානීන්ගේ අතකොලු බව වඩවඩා හඳුනා ගනිමින් සිටින ඇමරිකානු කම්කරුවන් අතර කෝපය දැල්වෙමින් පවතී.

ඊයේදා (15 දින) ඉන්දියානාපොලිස්හි ජෙනරල් මෝටර්ස් පිරිද්දුම් ෆැක්ටරියේ සේවය කරන මෝටර් රථ කම්කරුවන් කර්මාන්ත ශාලාව විකිනීමේ ගනුදෙනුවේ කොටසක් ලෙස සියයට පනහක වැටුප් කප්පාදුවක් භාරගන්නා ලෙස ඉල්ලා සිටි එක්සත් මෝටර් රථ කම්කරු සංගමයේ නිලධාරින් ට තදින් බැන පන්නා දැමුවෝ ය. මෙයට පෙර පසුගිය වසර අගදී ඩියර්බෝන්, මිචිගන්හි පැවති රෝග් කම්කරු හමුවකදී එක්සත් මෝටර් රථ කම්කරු සංගමයේ නව සභාපති බොබ් කින්ග්ට බැනවැදී එලවා දැමීම මගින් කුලුගැන්වුන සමාගමට සහන දීමේ ගිවිසුමක් ෆෝර්ඩ් කම්කරුවන් විසින් ප්‍රතික්ෂේප කලහ.

තවත් වැටුප් කප්පාදුවකට එරෙහි අරගලයක් වන නිව් යෝර්ක් නගරයේ ආහාර සැකසුම් කම්හලක කම්කරුවන් 305ක ගේ වැඩ වර්ජනයක් එහි 4 වන මාසයට එලඹෙමින් ඇත. ඩොක්ටර් පෙපර් ෂැපල් ව්‍යාපාර සමූහයේ අනුබද්ධ ආයතනයක් වන මොටෝ කම්කරුවෝ අවුරුද්දකට ඩොලර් 3,000ක වැටුප් කප්පාදුවක්, විශ්‍රාම අත්හිටුවීමක්, නව කම්කරුවන් සඳහා විශ්‍රම වැටුප් ගෙවීම නැවැත්වීමට සහ සෞඛ්‍ය රක්ෂන ගාස්තු වැඩි කිරීමක් පිලිගන්නා ලෙස ඉල්ලා සිටි විට එයට විරෝධය පාමින් වැඩ වර්ජනයක් සඳහා තම ඡන්දය භාවිතා කලහ.

අඟහරුවාදා (17දා) *නිව්යෝර්ක් ටයිම්ස්හි* පලවූ ලිපියක් එක්සත් ජනපද සංගත ප්‍රභූවේ - සහ මහ ව්‍යාපාරිකයන්ගේ පක්ෂ දෙකේම එහි දේශපාලන සේවකයන් ගේ - ඇමරිකානු කම්කරුවන් කෙරේ ඇති ආකල්පය ගැන අභිනිවේශයක් සැපයීය. ලිපිය සාකච්ඡාවල දී වැඩපල කලමනාකරුවෙකු කල ප්‍රකාශයන් පිලිබඳව විස්තර කල කම්කරුවෙකුගේ ප්‍රකාශයන් උපුටා දැක්වීය: "අප සෝයා බෝංචි හා තෙල් මෙන් වෙලඳ භාන්ඩ යක් බවත් වෙලඳ භාන්ඩවල මිල ඉහල පහල යන බව ඔහු පැවසීය.... රැකියා නොමැතිව මෙම ප්‍රදේශයේ දහස් ගනන් සිටින්නේ යැයි ද ඔවුන්ගෙන් ඕනෑම අයෙකු පැයකට ඩොලර් 14 බැගින් ගෙවා ලබා ගත හැකි" යයි ද ඔහු කීවේය.

කලමනාකරු සෝයා බෝංචි සහ කම්කරුවන් අතර වෙනස අවබෝධ කර ගැනීමට අසමත් විය. ඒත් කම්කරුවන්ට සටන් කිරීමට හැකිවා මෙන්ම ඔවුන් එය කරනු ඇත!

පසුගිය දශක තුනේදී පාවාදෙනු ද වෘත්තීය සංගම් විසින් ඔවුන්ගේ අරගල කඩාකප්පල් කරනු ද ලැබ ඇති ඇමරිකානු කම්කරුවෝ අතිශය දරුනු පන්ති සටන් සඳහා අවතීර්නවීමේ මුවවිටට එලඹ සිටිති. පසුගිය පරාජයන්ගේ පාඩම් ඉගෙනීම සහ එලඹෙන අරගල නව කාර්මික සහ දේශපාලනික මූලෝපායකින් මගපෙන්වනු ලැබීම අතිශය තීරනාත්මක ය. ඒ සඳහා ප්‍රථම පූර්ව කොන්දේසිය නම් කම්කරුවන් නිල වෘත්තීය සමිති වලින් බිඳී වෙන් වීමයි. වාඩි ලා ගැනීම් සහ වැඩ වර්ජන සැලසුම් කිරීම සඳහා සාමාජිකයන්ගේ සැබෑලෙසම පොදු සහ ප්‍රජාතන්ත්‍රීය සංවිධාන වන ස්වාධීන කම්හල් කමිටු නිර්මානය කල යුතුයි. වෘත්තීය සමිති මගින් බොහෝ කලකට පෙර අතහැර දමන ලද "එකෙකුට පහර සැමටමටම පහරක්" යන කම්කරු පන්තික මූලධර්මය මත මෙම අරගල පිටුපස හැකි පුලුල්ම සහයෝගය ගොනු කර ගත යුතුය.

පහල වැටුප් සහිත ඉන්දියානු බාහිරට පැවරීමේ ආයතන එක්සත් ජනපදයට සංක්‍රමනය වීම තවත් පාඩමක් උගන්වයි. වඩාත්ම අඩු වැටුප් සඳහා ධනපතියන්ගේ ගෝලීය පීරීමට කම්කරු පන්තියේ ගෝලීය පරිමාන ප්‍රතිචාරයක් ඉල්ලා සිටී. චීනයේ, යුරෝපයේ, බංගලාදේශයේ, ඉන්දියාවේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ මෑත දී ඇති වූ වැඩ වර්ජන ක්‍රියාවන්ගේ ඉහල යාම වැටුප් කප්පාදුවට සහ රැකියාවලින් දොට්ට ලෑම්වලට එරෙහි ලෝක කම්කරු පන්ති ප්‍රහාරයේ ආරම්භක ලක්ෂ්‍යය වියයුතු ය.

මෙය මුලු පාලක පන්තියටම, ඔබාමා පරිපාලනය සහ මහ ව්‍යාපාරිකයන්ගේ පක්ෂ දෙකටම එරෙහි දේශපාලන අරගලයකි. කම්කරු බලය සඳහා සහ සමාජ සමානතාවය ප්‍රවර්ධනය කෙරෙන සහ සමාගම් ලාභ සඳහා නොව සමාජ අවශ්‍යතා සඳහා වන ආර්ථික ජීවිතය නැවත ප්‍රතිසංවිධානය සඳහා සටන් වැදීමට මහජන සමාජවාදී ව්‍යාපාරයක් ගොඩ නැගිය යුතුය.

© www.wsws.org